**ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව - 2016**

**----------------------------------------------------------------**

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1987 අංක 47 දරන ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභා පනතේ 18 (3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**2.1 මතය**

------

මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**--------------------------------------**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

**----------------------------------------**

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

**(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01**

**-----------------------------------------**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටක හැර වත්කම් හා වගකීම් සහ ආදායම් හා වියදම් හිලව් නොකළ යුතු වුවත් ජංගම වත්කම් වලට එරෙහිව රු.73,089 ක ජංගම වගකීම් හිලව් කර ශුද්ධ අගය මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

**(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

**------------------------------------------**

(i) ප්‍රමිතයේ 69 වන වගන්තිය අනුව වත්කමක ක්ෂය කිරීම එය පාවිච්චි කිරීමට සූදානම් තත්ත්වයට ගෙන ආපසු ආරම්භ කළ යුතු බව දක්වා ඇතත් සලකා බලන වර්ෂයේ දෙසැම්බර් මාසය තුල මිලදී ගන්නා වත්කම් ක්ෂය නොකිරීම සභාවේ ක්ෂය ප්‍රතිපත්තිය වී තිබුණි.

(ii) ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.20,675,030 ක් වූ දේපළ පිරියත හා උපකරණ සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත්, තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ක්ෂය අනුපාත ඇස්තමේන්තු කිරීමේදී වූ දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

**----------------------**

ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පරිගණක මෘදුකාංග වලට අදාළ ක්ෂය රු.206,244 ක් අඩුවෙන් හා වත්කම් අයිතම් 7 ක් භාවිතයට ගත් දිනයේ සිට ක්ෂය නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ක්ෂය වීම් රු.17,677 ක් අඩුවෙන් දක්වා තිබුණි.

**2.2.3 පැහැදිලි නොකල වෙනස්කම්**

**-------------------------------**

පාරිතෝෂික වෙන්කිරීම් උපලේඛනය අනුව ශේෂය රු.6,609,102 ක් වූ අතර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව ශේෂය රු.8,314,850 ක් වූයෙන් රු.1,705,748 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.2,434,932 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 3,594,269 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,159,337 ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ සන්නිවේදන වියදම් රු.584,236 කින් හා අළුත්වැඩියා හා නඩත්තු වියදම් රු.362,265 කින් වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ශුද්ධ අලාභයක් ඇති වී තිබුණද 2015 වර්ෂයෙන් පසු ශුද්ධ ලාභයක් ඇති වී තිබුණි. එහෙත් 2015 වර්ෂයේ රු.3,594,269 ක් වූ ශුද්ධ ලාභය සමාලෝචිත වර්ෂයේදී රු.2,434,932ක් දක්වා අඩු වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී 2012 වර්ෂයේදී රු.16,607,312 ක් වූ ආයතනයේ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු.31,304,479 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1987 අංක 47 දරන ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභා පනත අනුව ආර්ථික වශයෙන්, ඵලදායී, පරිසර හිතකාමී හා සාමාජික වශයෙන් පිළිගැනෙන, ශක්තිමත් අන්තර්-ආයතනික සහයෝගීත්වය සහිත කෘෂිකාර්මික පර්යේෂණ හරහා කාර්මික අංශයේ ඵලදායීතාව, ලාභදායී බව හා තිරසාරත්වය සහතික කිරීම සහ ජාතික ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සභාවේ ප්‍රධාන කාර්යයන් වුවද එම කාර්යයන් ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන නිසි වේලාවට ලබා නොගැනීම නිසා එම කාර්යයන් ප්‍රමාණාත්මක ලෙස ඉටුකර ගැනීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදී පර්යේෂණ ප්‍රදාන වශයෙන් රු.8,796,700 ක් ලැබී තිබුණු අතර ක්‍රියාකාරී සැලැස්ම අනුව සැලසුම්කර තිබූ වැඩසටහන් 13 ක් අතුරින් වැඩසටහන් 04 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. තවද ජාතික කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති ප්‍රමුඛතා හඳුනාගැනීම, ජාතික කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති හා පර්යේෂණ වැඩසටහන් පිළිබඳ කාර්ය සාධනය හා සමාලෝචනය කිරීම, කෘෂිකාර්මික පර්යේෂණ කටයුතු වල විශිෂ්ඨතාවය නංවාලීමට සඳහා පහසුකම් සැපයීම, අන්තර් ආයතනික කෘෂිකාර්මික පර්යේෂණ ව්‍යාපෘති සඳහා කටයුතු සැලසීම යනාදී වැඩ සටහන්වල භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 39, 23, 25 හා 33 ක අවම මට්ටමක පැවතුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේ දී අවස්ථා තුනකදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර ආයතනයට අවශ්‍ය Fax Machine 01ක්, බහු මාධ්‍ය ඒකක(Multi Media Projector ) 01ක් හා ඡායා පිටපත් යන්ත්‍ර ( Photo Copy Machine) 01 ක් මිල දී ගැනීමට අවස්ථා 3 කදී එකතුව රු.338,670 ක් ගෙවා තිබූ අතර මෙම යන්ත්‍ර මිලදී ගැනීම සැලසුම් ගතව පිරිවැය හා කාලය අවම වන පරිදි එකවර මිලදී ගැනීම් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි.

**4.3 කාර්ය මණ්ඩල කළමනාකරණය**

--------------------------------------

සභාවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ, (පර්යේෂණ කළමණාකරණ) තනතුර 2013 වර්ෂයේ සිටද ජාල පරිපාලක තනතුර එම තනතුර ස්ථාපනය කළ දින වූ 2014 පෙබරවාරි 26 දින සිට ද පුරප්පාඩුව පැවති නමුත් විගණන දිනය වූ 2017 මැයි 30 දින දක්වාම බඳවාගැනීමට කටයුතු කර නොතිබුණි.

**5 ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

---------------------------------------

**5.1 වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම**

---------------------------------

2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**5.2 අයවැය ලේඛනමය පාලනය**

-------------------------------

සමාලෝචිත වර්ෂයේ අයවැය ගත අයිතම 36 ක වියදම් තත්‍ය වියදම් සමඟ සැසඳීමේදී සියයට 20 සිට සියයට 1939 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) සේවක පරිපාලනය | බඳවා ගැනීමේ පරිපාටියට අනුකූල නොවීම. |
| (ආ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය | විධිමත් පරිදි පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම හා පිරිවැය හා කාලය අවම වන පරිදි සැලසුම් කර නොතිබීම. |
| (ඇ) මූල්‍ය පාලනය | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කර නොතිබීම. |
| (ඈ) මෙහෙයුම් පාලනය | කෘෂි ක්ෂේත්‍රයට අදාල ගැටළු වලට විසඳුම් වශයෙන් සාර්ථක පර්යේෂණ ක්‍රියාත්මක නොවීම. |